## ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු වැඩමුළුව

2023 දෙසැම්බර් 06 වන දින අමාත්‍යාංශයේ සියලු ආයතනවල නිලධාරීන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව පුහුණු වැඩමුළුවක් කොළඹ කින්ස්බරී හෝටලයේ දී පැවැත්විණි. ඒ සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 53 දෙනෙකු සහභාගී වූ අතර සමස්ත වැඩසටහනේ මූල්‍ය හා තාක්ෂණික දායකත්වය එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) මඟින් දරන ලදී.

වැඩමුළුවේ දේශන මෙහෙයවමින් සම්පත්දායකත්වය ලබා දුන්නේ වෛද්‍ය මනෝජ් ප්‍රනාන්දු මහත්මාය. රුහුණු විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපති වන එතුමා UNFPA ආයතනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥවරයෙකු ලෙස ද කටයුතු කරනු ලබන පළපුරුදු දේශකයෙකි.

අමාත්‍යාංශය වෙනුවෙන් සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලද අතර ඉදිරියේ දී මෙවන් වූ වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන් මඟින් අමාත්‍යාංශය විසින් ගනු ලබන තීරණ, ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය කිරීමේ කාර්යයන් හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අවශ්‍යතාවයන් හා ගැටලු සම්බන්ධයෙන් නිවැරදිව හා ඵලදායීව කටයුතු කිරීමට අවශ්‍ය අවබෝධය, ප්‍රමාණාත්මක දැනුම හා සංවේදීතාවය නිලධාරීන් වෙත ලැබෙනු ඇත.

## ළමා හා කාන්තා ආරක්ෂාව සඳහා නවීන හා තාක්ෂණික ප්‍රවේශයක් - කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - "ඩිජිටල් වෙරළ" සමාරම්භක හමුවීම

2023.12.07 වන දින අමාත්‍යාංශයේ සියලු ආයතනවල නිලධාරීන් වෙනුවෙන් කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශයේ පළමු මහළ ශ්‍රවනාගාරයේ දී පැවැත්විණි. මේ සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් 55 දෙනෙක් සජීවීව ද 26 දෙනෙකු මාර්ගගත ක්‍රමය ඔස්සේ ද සහභාගී විය.

මේ සඳහා වැඩසටහන මෙහෙයවමින් සම්පත්දායකත්වය ලබා දුන්නේ ආචාර්ය රංග රුද්‍රිගු මහතාය. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී ලෙස කටයුතු කරන එතුමා නවීන තාක්ෂණ භාවිතයන් පිළිබඳ පළපුරුදු ආචාර්යවරයෙක් මෙන්ම දේශකයෙකි.

අමාත්‍යාංශය වෙනුවෙන් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය විසින් ක්‍රියාවට නංවන ලද අතර ඉදිරියේ දි මෙවන් හරවත් වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන් හි ප්‍රධාන අරමුණ වනුයේ නවීන තාක්ෂණය සමඟ ඩිජිටල්කරණය වෙමින් පවතින ලෝකයට යොමු වීමේ දී කාන්තාවන් හා දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාකරන මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා සාම්ප්‍රදායික ක්‍රම වලින් ඔබ්බට ගොස් නවීන ක්‍රමෝපායන් භාවිතය සඳහා ඇති ධාරිතාව සංවර්ධනය කිරීමයි.